# දැන්වීමයි !

## රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ

## තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී / සැලසුම් ශිල්පී III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

1.0 රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරී තනතුරු 03 ක් සහ සැලසුම් ශිල්පී තනතුරු 01 ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

4.0 **අවශ්‍ය සුදුසුකම්**

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) **අධ්‍යාපන සුදුසුකම් :**

(I) විද්‍යා / ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය එකවර සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ 4) සම්පූර්ණ කර තිබීම

හා

(II) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 3 (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

(ඊ) **වෘත්තීය සුදුසුකම් :**

(I) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(II) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(IV) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම හෝ

(VI) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

(VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(එ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ඒ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5.0 **වැටුප් පරිමාණය :** රු. **31,040/- 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 57,550/-**

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN 3 - 2016 වැටුප් කේතය අදාළ වේ)

6.0 **විභාග පරිපාටිය**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරාගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්යය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. |

7.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

.............................................

**(දෙපාර්තමේන්තු ප්‍රධානී)**

**2021 මාර්තු මස ....................................... දින**

ඒ සඳහා වන අයදුම්පත හා අදාළ කොන්දේසි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර එය සම්පූර්ණ කර 2021.04.10 දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත යොමු කළ යුතුය.